# බුදු රජාණන් වහන්සේගේ ගුණ සිහි කර ගසේ තිබියදී ම මල් පූදා නිවන තෙක් දුගති දොර වසන්න

## කිංසුකපූජක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 512 - 513)

කැල (එරබදු) ගසක මල් පිපී තිබෙනු දුටු කෙනෙක් ඇඟිලි බැඳ ගෙන සිද්ධාර්ථ බුදු රජාණන් වහන්සේගේ ගුණ සිහි කර ඒ මල්, ගසේ තිබියදී ම බුදු රජුන්ට පූජා කළා.

අතටවත් නොගෙන කළ ඒ මල් පූජාවෙන් ඔහු කල්ප අනූ හතරක් දුගතියක නොඉපදී ගෞතම බුදු රජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදි ව සියලු කෙලෙසුන් නසා රහත් බව ලැබුවා.